**මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2011 නොවැම්බර් 01 දින සිට අරමුදල ජනාධිපති ලේකම් කාර්යාලය යටතට පත් කර තිබුණද, විගණනයට ඉදිරිපත් කළ 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල භාර මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස සහතික කිරීම කර තිබුණේ සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසිනි. එසේම, 2011 වර්ෂයට අදාල කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 29 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර 2012 අප්‍රේල් 27 දින නැවතත් සංශෝධිත කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලදී.

#### 1.2.2 ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 26 ට අනුව, අරමුදලට පූර්ණ අයිතියක් ඇති සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම ඒකාබද්ධ කරමින් ඒකාබද්ධ මූල්‍ය පකාශන පිළියෙල කළ යුතු වුවද, 2003 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කිරීමට අරමුදල ක්‍රියා කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය විසන් පවත්වා තිබුණු මහපොල වෙළඳ ප්‍රදර්ශනයෙන් ලැබිය යුතු රු.3,270,082 ක් වු අතිරික්ත ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) ආයෝජන කර තිබුණු මුළු මුදල රු.461,207,812 වුවද, තොරතුරු තාක්ෂණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලවල එය රු.373,577,393 ක් ලෙස දක්වා තිබුණෙන් රු.87,630,420 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, මෙම වෙනස දිගුකාලීනව කපා හරින බව සටහන අංක 01 හි අනාවරණය කර ඇත.

### 1.2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) මු.රෙ. 264 | ආදායකයා විසින් මුදල් ලබා ගත් බවට සහතික කෙරෙන කුවිතාන්සි ලබා ගත යුතු වුවද, එකතුව රු.49,414,250 ක් වූ ශිෂ්‍යත්ව ගෙවීම් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටු වී නොතිබුණි. |
| (ඇ) මු.රෙ. 396 (ඇ) | අරමුදලින් නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ එකතුව රු.2,628,700 ක වටිනාකමැති චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා, පෙර වර්ෂ ගැලපුම්වලට සහ පාඩු හා කපා හැරීම්වලට පෙර අරමුදලේ අතිරික්තය රු.421,249,846 ක් වූ අතර, එයට අනුරූපව, පෙර වර්ෂ ගැලපුම්වලට සහ පාඩු හා කපා හැරීම්වලට පෙර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.435,069,815 ක් වූයෙන් රු.13,819,969 කින් මූල්‍ය ප්‍රතිඵල වල පිරිහීමක් දක්නට ලැබුණි. ඒ සඳහා 2011 වර්ෂයේදී නැට්වෙල්ත් ලාභාංශ ආදායම නොලැබීම මූලිකව බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

අරමුදල මගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම පිළිබඳ තොරතුරු හා වැදගත් සංඛ්‍යා ලේඛන සමහරක් පහත දැක්වේ.

| වර්ෂය | විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සිසුන් සංඛ්‍යාව | විශ්ව විද්‍යාල සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව විශ්ව විද්‍යාල වලට ඇතුළත් කර ගත් සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | කාර්මික විද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ප්‍රදානය කරන ලද මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව | ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා දරන ලද වියදම | ශිෂ්‍යත්ව ප්‍රදාන උත්සව වියදම් |
|---|---|---|---|---|---|---|---|
| | | | % | | | රු. | රු. |
| 1999/2000 | 11,324 | 5,958 | 52.6 | 550 | 6,508 | 229,443,550 | 5,118,665 |
| 2000/2001 | 11,717 | 6,275 | 53.5 | 601 | 6,876 | 245,651,650 | 2,982,856 |
| 2001/2002 | 11,380 | 6,206 | 54.5 | 417 | 6,623 | 362,024,850 | 3,690,075 |
| 2002/2003 | 23,568 | 12,246 | 52.0 | 522 | 12,768 | 379,473,500 | 4,622,591 |
| 2003/2004 | 12,623 | 8,147 | 64.5 | 550 | 8,697 | 437,707,100 | 785,597 |
| 2004/2005 | 13,653 | 9,000 | 65.9 | 847 | 9,847 | 487,929,950 | 516,476 |
| 2005/2006 | 15,478 | 8,009 | 51.7 | 1,335 | 9,344 | 644,682,550 | 941,490 |
| 2006/2007 | 15,996 | 7,799 | 48.8 | 1,045 | 8,844 | 717,665,900 | 3,050,987 |
| 2007/2008 | 18,714 | 9,500 | 50.7 | 1,663 | 11,163 | 711,135,000 | 1,328,963 |
| 2008/2009 | 19,340 | 10,000 | 52.0 | 1,500 | 11,500 | 695,747,550 | 2,057,249 |
| 2009/2010 | 20,111 | 10,000 | 49.72 | 1,564 | 12,574 | 763,746,500 | 2,035,922 |
| 2010/2011 | 20,274 | 10,300 | 50.80 | 1,500 | 11,800 | 694,519,600 | 2,876,999 |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව ලබාදීම

2011 වර්ෂය තුළ අරමුදලින් ලබාදුන් ශිෂ්‍යත්ව හා ඊට අදාල ගෙවීම් පිළිබඳ විස්තර පහත පරිදි විය.

| අධ්‍යයන වර්ෂය | 2007/2008 | 2008/2009 | 2009/2010 |
|---|---|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රවේශය ලත් සිසුන් සංඛ්‍යාව | 18,714 | 19,340 | 20,111 |
| අරමුදලේ භාර මණ්ඩලය විසින් විශ්ව විද්‍යාල සඳහා වෙන් කරන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | 9,500 | 10,000 | 10,000 |
| පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව | 8,787 | 9,006 | 8,868 |

මේ සම්බනධයෙන් හා ඊට අදාල ගෙවීම් පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අරමුදල විසින් ශිෂ්‍යත්වලාභීන්ට මුදල් ගෙවීමේදී එක් එක් මාසය සඳහා නියමිත අවසාන දිනයක් තීරණය කර ගෙවීම් කිරීමට විශ්ව විද්‍යාල වලට උපදෙස් ලබා දී තිබුණද, ඒවා නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා වාරික ගෙවීමෙන් පසු ඉතිරි වන මුදල් ප්‍රමාදයකින් තොරව ආපසු ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නියැදි පරීක්ෂාවට අනුව, විශ්ව විද්‍යාල 05ක ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීම මාස 01 සිට මාස 10 දක්වා කාලයක් හිඟ හිට තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පාසැල් සංවර්ධන කටයුතු

---------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂනය විය.

(I) 2011 ජූනි 21 දින වනවිට පන්ති කාමර සහිත ශ්‍රවණාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මාලඹේ පිරිමි විද්‍යාලයට රු. 4,366,838 ක් ලබා දී තිබුණු අතර 2011 ජූනි 21 දින සිදු කල භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 ජනවාරි 18 දින අධ්‍යාපන අමාත්‍යාංශය හා පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු අතර එළඹී තිබුණු ගිවිසුමට අනුව, ද්විතියික අධ්‍යාපන හා නවීකරණ ව්‍යාපෘතිය මගින් අරමුදල් ලබාගෙන ඉහත ගොඩනැගිල්ලේ අදියර I හි ඉදිකිරීම් කටයුතු අවසන් කර තිබුණි. ගිවිසුම්ගත මුදල රු.4,022,269 (වැට් රහිත) ක් විය. නමුත් අංක ඊඩී/07/99/07/12/10 හා 2010 ඔක්තෝබර් 28 දිනැති ලිපිය අනුව, ඉහත ගොඩනැගිල්ලේ අදියර I හි ඉදිකිරීම් කටයුතු සඳහා මහපොළ අරමුදලින්ද රු.4,366,838 මුදලක් යොදා ගත් බව දැක්වෙතත් මහපොළ අරමුදලින් එහි ඉදිකිරීම් කටයුතු සිදු කර නොතිබුණි.

(ii) 2010 දෙසැම්බර් 08 දින ඉහත සඳහන් රු.4,366,838 ක මුදල අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබී තිබුණද, එය තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. එම මුදල් ඒ වනවිටත් වෙනත් පාසල්වල ඉදිකිරීම් වෙනුවෙන් ගෙවීමට තිබූ රු.4,193,629 ක වූ හිඟ මුදල් ගෙවීම සඳහා යෙදවීමට යෝජනා කර තිබුණි.

(iii) 2010 පෙබරවාරි 06 දින මෙම ස්ථානයේ තිබූ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කර පංති කාමරවල සිටි සිසුන් තාවකාලික ගොඩනැගිල්ලක රඳවා තිබුණි. නව ගොඩනැගිල්ල සම්පූර්ණ කර සිසුන් එම ගොඩනැගිල්ලට මාරු කිරීම වහාම කළ යුතුව තිබුණද 2011 ජූනි මස වන විට ඉදිකිරීම් කටයුතු නවතා දමා තිබුණි.

(II) හංවැල්ල රාජසිංහ විද්‍යාලයේ ක්‍රීඩාංගණය නවීකරණය කිරීම සඳහා රු. 22,317,500 ක් වෙන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අංක 50/05 භාර මණ්ඩල පත්‍රිකාව මගින් මේ සඳහා රු.මිලියන 20 ක් වෙන්කර තිබුණද පසුව එම මුදල රු.මිලියන 25 දක්වා වැඩි කර තිබුණි. 2010 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.24,046,747 ක මුදලක් ගෙවා තිබුණු නමුත් විගණිත දිනය වූ 2011 ජූනි 20 දින වන විටත් ඉහත කී

වැසිකිළි හා නාන කාමර පද්ධතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ii) ඉහත ඇස්තමේන්තු අංක 02 අනුව පොළොව සැකසීම සඳහා රු.13,247,500 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම කටයුතු නිසියාකාරව සිදු නොකිරීම නිසා ක්‍රීඩා පිටියට දැඩි හානි සිදුවී තිබීම හේතුවෙන් එම පාසලේ නිවාසාන්තර ක්‍රීඩා කටයුතු පැවැත්වීම අඩාලවී තිබුණි. එහෙයින් අනෙකුත් පුහුණුවීම් කටයුතු සඳහා අමතර පිරිවැයක් දැරීමට සිදුවීම වැනි අවාසිදායක තත්ත්වයන්ට පාසලට මුහුණ දීමට සිදුවී තිබුණි.

### 3. 3 අවිධිමත් ගනුදෙනු

--------------------

අරමුදල විසින් 2008 අප්‍රේල් 07 දින සිට වසර 04 ක කාලයක් සඳහා පිටපතකට රු.2.30 බැගින් (වැට් සමඟ) මසකට අවම පිටපත් 3,000 ක් ලබා ගැනීමේ කොන්දේසි මත බහුකාර්ය පරිගණක මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගෙන තිබුණු අතර ඒ සඳහා 2011 අගෝස්තු දක්වා ගෙවා තිබුණු මුළු මුදල රු.364,369 ක් විය. ගිවිසුම අනුව මාසිකව අවම පිටපත් සංඛ්‍යාව ලබා ගැනීමට නොහැකි වීම නිසා ලබා නොගත් පිටපත් 6,144 ක් සඳහා රු.14,142 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 3.4 මතභේදයට තුඩුදෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අංක 39/03 හා 2002 මැයි 13 දිනැති භාර මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව, අරමුදල සතු අතිරික්ත මුදල්, තරඟකාරී මූල්‍ය වෙළඳපොලේ ආයෝජනය කිරීම තුළින් ඉහළ ඉපයීමක් කළ හැකි පරිදි අරමුදල් කළමණාකරනය කිරීමේ අපේක්ෂාවෙන් රු.200,000,000 ක මූලික ප්‍රාග්ධන දායකත්වයකින් සීමාසහිත නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, 2003 මාර්තු 23 දින ස්ථාපනය කර තිබුණි. කෙසේ නමුත්, 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය ප්‍රකාර, මෙහි මුදල් ආයෝජනය සඳහා මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. කෙසේ වෙතත් අරමුදල විසින් 2011 දෙසැම්බර් 31 දිනට කළමනාකරණය පිණිස සමාගම වෙත භාර දී තිබුණු මුළු මුදල රු.5,125,204,995 ක් විය. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) අරමුදල යෙදවූ රු.200,000,000 ක මූලික ප්‍රාග්ධනයට 2003 සිට 2007 වර්ෂය දක්වා එනම් වර්ෂ 05 ක් සඳහා කිසිම ලාභාංශයක් ලැබී නොතිබුණු

අතර, 2008, 2009 හා 2010 වර්ෂ සඳහා ලාභාංශ ලෙස පිළිවෙලින් රු.මිලියන 5 ක්, රු. මිලියන 4.8 ක් හා රු.මිලියන 60.5 ලැබී තිබුණි. 2011 වර්ෂයේ භාර මණ්ඩල පත්‍රිකා අංක 52/09 අනුව, 2011 ඔක්තෝබර් 31 දිනට ඉහත සමාගමේ ලාභය රු.74,161,271 ක් වූ නමුත් 2011 වර්ෂය සඳහා අරමුදලට කිසිදු ලාශාංශයක් ලැබී නොතිබුණි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට අරමුදල සතු රු. 5,125,204,995 ක අරමුදල් ඉහත සමාගම තුල ආයෝජනය කිරීමෙන් රු.508,742,060 ක පොලී ආදායමක් උපයා තිබුණද, ඉන් රු.7,911,887 ක් අදාල සමාගමේ වත්කම් කළමනාකරණ ගාස්තු හා භාරකාරත්ව ගාස්තු ලෙස රු.9,653,445 ක් අඩු කිරීමෙන් පසු රු. 499,088,615 ක මුදලක් අරමුදල වෙත ගෙවා තිබුණි. අරමුදල බදු වලින් නිදහස් ආයතනයක් වන බැවින් ඉහත මුදල් සෘජුව ආයෝජනය කර තිබුණේ නම් රු. 9,653,445 ක් වූ මුදල ඉතිරි කර ගත හැකිව තිබුණි.

(iii) 2004 වර්ෂයෙන් පසුව ඉහත කී සමාගම අක්‍රිය තත්වයට පත් වී ඇති අතර තරඟකාරීත්වයෙන් තොරව වෙළඳපොල තුල ක්‍රියාත්මක වීම නිසා තරඟකාරී පොලී අනුපාතයන්ටත් වඩා අඩු පොලියක් අරමුදලට ලැබී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය

---

(i) මහපොළ භාරකාර මණ්ඩලය හා ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය අතර 2005 නොවැම්බර් 14 දින එළඹුන ගිවිසුමේ 4(බී) වගන්තිය අනුව, මහපොළ අරමුදලේ ලේකම්, ප්‍රධාන ගණකාධිකාරී හා තවත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් තිදෙනෙකු, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කළ යුතු වුවද, අරමුදලින් සාමාජිකයින් දෙදෙනෙකු හා අරමුදලට පිටතින් සාමාජිකයින් තිදෙනෙකු වශයෙන් සාමාජිකයන් පස් දෙනෙකු පත් කර තිබූණි.

(ii) ගිවිසුමේ 5(අ) (ii) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ උපාධිය සඳහා ශිෂ්‍යත්ව 25 ක් භාර අරමුදල නමින් ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු වුවද, මේ දක්වා ශිෂ්‍යත්ව පිරි නැමීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගිවිසුමේ 4(ඕ) වගන්තිය අනුව, අරමුදල විසින් බදු ලබා දී තිබූ භූමිය, ශ ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය විසින් වසර දහයක් තුළ සංවර්ධනය කළ යුතු අතර, එසේ යොදා නොගනනේ නම් එම භූමිය වෙනත් ව්‍යාපෘතියකට යෙදවීමට අරමුදලට

හිමිකම් තිබුණද, ඉහත කී වසර දහයක කාල සීමාවෙන් වසර 05 ක් ඉක්ම වී තිබුණද 2012 දෙසැම්බර් 18 දින දක්වාත් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

## 3.5 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2011 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 04 | 01 |
| මාණ්ඩලික නොවන | 11 | 04 | 07 |
| කණිෂ්ඨ | 03 | 02 | 01 |
| | 19 | 10 | 09 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත සේවක සංඛ්‍යාව 19 ක් ලෙස දැක්වුවද, ඒ සඳහා අංක 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ආ) අරමුදලේ මාණ්ඩලික තත්ත්වයේ තනතුරු 03 ක් පුරවා තිබුණේ , වයස් සීමාව අවුරුදු 60 ඉක්මවූ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් එක් නිලධාරියෙකුගෙන් හා වැඩ බැලීමේ පත්වීම් 02 ක් මගිනි.

(ඇ) අරමුදලේ ප්‍රධාන විධායක වන අධ්‍යක්ෂවරයාද වයස අවුරුදු 60 ඉක්මවූ හා මාසිකව රු.12,000 ක වැඩ බැලීමේ දීමනාවක් ලබා ගන්නා නිලධාරියෙකු විය.

(ඈ) කණිෂ්ඨ සේවයේ යොදවා සිටි සේවකයින් දෙදෙනාද අනියම් පදනම මත බඳවා ගෙන තිබුණු අතර එම සේවකයින්ට සහ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරියාට අංක 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.10 ට අනුව අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ සභාපතිවරයා වෙත වාර්තා කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අරමුදල් කළමණාකරනය

(ඇ) ශිෂ්‍යත්ව

(ඈ) පාසල් සංවර්ධන අරමුදල

(ඉ) කාර්ය මණ්ඩලය